**රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල - 2022**

**------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය ව්‍යාචනය**

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.2 මතය ව්‍යාචනය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ව්‍යාචනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව;

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විෂය | මුදල රු. මිලියන | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක වී ඇති සාමාජිකයින් සංඛ්‍යාව 267,379 ක් ලෙස දක්වා ඇති අතර එක් එක් සාමාජිකයන් සම්බන්ධයෙන් තොරතුරු දත්ත පද්ධතියට ඇතුලත් නොකිරීම හේතුවෙන් දායක මුදල් ලැබීම් හා ගෙවීම් නිවැරදිව සටහන් තැබීමට ක්‍රම වේදයක් හඳුනාගෙන නොතිබුණි. තවද වර්ෂය අවසාන දිනට ලැබිය යුතු දායක මුදලේ හා ගෙවිය යුතු දායක මුදලේ වටිනාකම හඳුනාගෙන ගිණුම් ගත කර නොතිබුණි. | | එක් එක් සාමාජිකයින් සම්බන්ධයෙන් තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් නොතිබීම. | 2022 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලේ සාමාජික සංඛ්‍යාව 267,379 ලෙස සටහන් වි ඇත්තේ, පෙර වර්ෂයේ අවසානයේ සාමාජික සංඛ්‍යාවට 2022 නව සාමාජිකයින් එකතු කර ප්‍රතිලාභ ගෙවන ලද සාමාජිකයින් අඩු කිරීමෙනි. | විධිමත් දත්ත පද්ධතියක් පවත්වා ගත යුතුය. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබූ ලැබිය යුතු රජයේ දායක මුදල සඳහා උපලේඛන ඉදිරිපත් කර | 212.20 | කේවල ශේෂ උපලේඛන | කේවල ගිණුම් පවත්වා ගෙන නොයාම හේතුවෙන් මෙම අගය කුමන දායකයන්ගේ ශේෂ ද යන්න අනාවරණය කර ගත | දායකයින්ගේ කේවල ගිණුම් පිළිබඳ විධිමත් දත්ත |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නොතිබූ බැවින් කවර ආයතනයන්ගෙන් කුමන දායකයින් සඳහා ලැබිය යුතුද යන්න තහවුරු නොවුණි. | | | නොහැක. | පද්ධතියක් පවත්වා ගැනීම මඟින් ශේෂයන්හි නිවැරදිතාවය තහවුරු කරගත යුතුය. |
| (ඈ) | එක් එක් දායකයා අනුව වෙන් කළ හැකි පරිදි කේවල ශේෂ උප ලේඛන ඉදිරිපත් කර නොතිබූ බැවින් අනිවාර්ය දායක මුදල් ගිණුමේ ශේෂය හා රජයේ දායක මුදල් ගිණුමේ ශේෂය නිවැරදිතාවය තහවුරු නොවුණි. | 33,593.60<br>51,808.74 | කේවල ශේෂ උපලේඛන | මෙම ශේෂය තහවුරු කර ගැනීමට කේවල ගිණුම් පවත්වා ගැනීම අත්‍යාවශය වන අතර ඒ සඳහා දැනට හඳුන්වා දී ඇති පද්ධතිය ක්‍රමවත්ව පවත්වාගෙන යාම අවශ්‍යය වේ. තව දුරටත් සාමාජික අංක ලබා නොගෙන කටයුතු කරන ආයතන ඇති බැවින් මෙය තරමක් දුෂ්කර කාර්යයක් බවට පත් වී ඇත. | දත්ත පද්ධතියක් පවත්වා ගැනීම මඟින් ශේෂයන්හි නිවැරදිතාවය තහවුරු කරගත යුතුය. |
| (ඈ) | ස්වෙච්ඡා දායක මුදල් ගිණුමේ ශේෂය සම්බන්ධයෙන් හිමිකම් ලබන්නන්ගේ තොරතුරු සහිත උපලේඛන විගණනයට ඉදිරිපත් නොවූ බැවින් එම ශේෂයෙහි නිවැරදිතාවය තහවුරු නොවුණි. | 51.98 | හිමිකම් ලබන්නන්ගේ තොරතුරු සහිත උපලේඛන | ස්වෙච්ඡා දායක මුදල් සඳහා සාමාජිකයන් දායක වීම මේ වන විට සිදු නොවන අතර ගෙවීම් සඳහා ඉදිරිපත් වන අයදුම්පත්‍ර සඳහා තොරතුරු ලිඛිතව ගෙන්වා ගෙන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් අංශය වෙත ඇති තොරතුරු සමඟ සසඳා බලා තහවුරු කර ගෙන ගෙවීම් කරනු ලැබේ. | දත්ත පද්ධතියක් පවත්වා ගැනීම මඟින් ශේෂයන්හි නිවැරදිතාවය තහවුරු කරගත යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1942 රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් පනතේ 25 වන වගන්තිය | එක් එක් මුදල් වර්ෂය අවසාන වීමෙන් පසු විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක විසින් එම දිනයේ දී අරමුදලේ තමාගේ නමින් බැරට පවත්නා මුළු මුදල් ප්‍රමාණය එක් එක් දායකයා වෙත දැනුම් දිය යුතු වුවත් එම අවශ්‍යතාවය ඉටු කිරීමට ක්‍රම වේදයක් සකස් කර නොතිබුණි. | කේවල ගිණුම් ශේෂ ලබා දීම සඳහා 2017 වර්ෂයේ දී ආරම්භ කරන ලද දායක මුදල් මාර්ග ගත ක්‍රමය හරහා එවීමේ ක්‍රියාවලිය ආයතන බොහොමයක් අනුගමනය නොකිරීම හේතුවෙන් කේවල ගිණුම් පවත්වා ගෙන යාමට නොහැකි වී ඇත. | පනතේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 8,273.96 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.මිලියන 6,570.59 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 1,703.37 ක වැඩිවීමක් නිරීක්ෂණය විය. මෙම වැඩිවීමට ආයෝජන මත පොළී ආදායම රු.මිලියන 1,707.58 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අරමුදලේ සාමාජික සංඛ්‍යාව, අලුතින් එකතු වූ සාමාජික සංඛ්‍යාව, වර්ෂය තුල ගෙවීම් කර ඉවත්වූ සාමාජික සංඛ්‍යාව සහ වර්ෂය අවසාන දිනට අරමුදලේ සාමාජික සංඛ්‍යාව කොපමණද යන්න තහවුරු කිරීමට සාක්ෂි ඉදිරිපත් නොවුණි. | වාර්ෂිකව රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට එක් වන සාමාජික සංඛ්‍යාව (නව සාමාජිකයින්) හා වර්ෂය තුළ ලද අයදුම්පත්වලට ගෙවීම් කිරීමෙන් පසු සාමාජිකත්වය අහෝසි වීම/ ප්‍රතිලාභ ලද සාමාජිකයන් සංඛ්‍යාව ගැලපීමෙන් පසු රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලේ සාමාජික වර්තමාන සංඛ්‍යාව, ගණනය කෙරේ. මෙම අගය වාර්ෂික ගිණුම් වල දැක්වෙන පෙර වර්ෂයේ අවසාන සාමාජික සංඛ්‍යාවට ගැලපුම් කිරීමෙන් දිගින් දිගටම අරමුදලේ සාමාජික සංඛ්‍යාව දක්වා ඇත. | විධිමත් දත්ත පද්ධතියක් පවත්වා ගත යුතුය. |
| (ආ) | පොළී ආදායම දායකයින් අතර විසර්ජනය කිරීම සඳහා ආරම්භක මාසික වෙන් කිරීම් වටිනාකම රු.මිලියන 8,273.96 ක සාමාන්‍ය අගයක් පදනම් කොට ගෙන අනුපාතය තීරණය කර තිබුණද එසේ අනුපාතය තීරණය කිරීමේ පදනම විගණනයට අනාවරණය නොවුණි. සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 1,741.90 ක් දායකයින් අතර නොබෙදා පොදු සංචිතයට මාරු කර තිබීමෙන් පොලී ආදායම දායකයින් අතර සම්පූර්ණයෙන් බෙදී යාමක් සිදු නොවන බව නිරීක්ෂණය විය. | අතීතයේ සිට මෙම ක්‍රමය මත පොළී විසර්ජනය සිදු කර ඇත. ඒ ඒ වර්ෂය සඳහා සාමාජිකයන්ට ගෙවිය යුතු පොළී අනුපාතය කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරන අතර ඒ අනුව 2022 වර්ෂයේ පොදු සංචිත ගිණුමට රු.මිලියන 1,741.90 ක් මාරු කර ඇත. අරමුදලේ සංචිත හරහා මූල්‍ය ශක්තිය වැඩිකර ආයෝජන හරහා පොළී ඉපයීම් වර්ධනය කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. | පොළී ආදායම විසර්ජනය කිරීම සඳහා විධිමත් පදනමක් අනුමත කර ගත යුතුයි. |